මගේ අංකය : ED/02/01/බ.ගැ.පරි.(පොදු)
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක 353, කෝට්ටේ පාර,
රාජගිරිය
2024.06.04

ස්ථානාධිපති (තොරතුරු තාක්ෂණ)

**වෙබ් අඩවියේ පළ කරන මෙන් ඉල්ලීම**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටියෙහි සිදු කරන ලද සංශෝධන ඇතුලත් ඇමුණුම 1 හා ආවරණ ලිපිය මේ සමග එවන අතර, එම ලේඛන දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

රෝහණ සේනාරත්න
සුරාබදු කොමසාරිස් (පාලන හා මානව සම්පත් )
සුරාබදු කොමසාරිස් ජනරාල් වෙනුවට

කාර්යාල
දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136605
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876160, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

16 MAY 2024

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/03-01-02/04/2014
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.05. 13

ලේකම්,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

**<u>ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධව ඔබගේ අංක MFI/02/20/EXC/3 හා 2024.02.22 සහ MFI/02/20/EXC/8 හා 2024.02.12 දිනැති ලිපි හා බැඳේ.

02. එම ලිපි සම්බන්ධව සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත තීරණ ලබා දී ඇති බව එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වා සිටිමි.

I. සුරාබදු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය මේ සමඟ අමුණා ඇති ඇමුණුම 01 පරිදි සංශෝධනය කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2024.05.07 දිනැතිව අනුමත කර ඇති අතර ඒ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධනයන් බඳවා ගැනීමේ පටිපාටියෙහි සටහන් කර තබන ලෙසත් ඔබට දැන්වීමට.

II. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 642/2012 සඳහා ලබාදුන් තහනම් නියෝගය අනුව මෙම තනතුරුවලට බඳවා ගැනීම් වසර 10ක් පමණ දීර්ඝ කාලයක් ප්‍රමාද වීම සහ අනුමත කාර්ය මණ්ඩල අනුමැතිය ඉක්මවා නිලධාරීන් විසි තුන් දෙනෙකු (23) බඳවා ගැනීම සඳහා ලබාදී ඇති අංක PSC/APP/20/8/33/2022 හා 2024.05.07 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය අනුව කරුණු සලකා බලා සුරාබදු අධිකාරී තනතුරේ සිට සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීමේදී සුරාබදු අධිකාරී තනතුරෙහි සේවා කාලය වසර 03ක් ලෙස <u>මෙම අවස්ථාවට පමණක්</u> සලකා බැලීමට අනුමැතිය ලබාදීමට.

දේශමාලී කුමාරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට.

පිටපත: සුරාබදු කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස.

(ඇමුණුම 01) 64

<u>සංශෝධන ලැයිස්තුව</u>

<u>ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය</u>

| අනු අංකය | ඡේද අංකය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 01. | 7.3.4.1 වගුව | ලිඛිත විභාගය |

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා අදාළ විෂය පිළිබඳ වූ දැනුම | 100 | 40% |
| 2. සාමාන්‍ය දැනුම | 100 | 40% |
| 3. බුද්ධි පරීක්ෂණය | 100 | 40% |

(විෂය නිර්දේශය ඇමුණුම 01හි සඳහන් වේ.)

| අනු අංකය | ඡේද අංකය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 02. | ඇමුණුම 01 | 01. විභාගය පිළිබඳ විස්තර : ලිඛිත පරීක්ෂණයකි. |

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා අදාළ විෂය පිළිබඳ වූ දැනුම | පැය 02 | 100 | 40% |
| 2. සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 40% |
| 3. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |

02. නොවෙනස්ව පවතී.
03. නොවෙනස්ව පවතී.
04. විභාගය සඳහා වන විශය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා අදාළ විෂය පිළිබඳ වූ දැනුම | වෙනසක් සිදු නොවේ. |
| 2. සාමාන්‍ය දැනුම | වෙනසක් සිදු නොවේ. |
| 3. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය සහ තීරණ ගැනීමේ හැකියාව වැනි කරුණු නිශ්චය කරනු ලැබීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. |